# දාවිත් සහ ගෝලියත්

– 22nd Story–



159Page

පොතේ ගුරා — එල්කානා නම් මනුෂ්‍යයෙක් ඉශ්රායෙල්හි ජීවත් වුණා. ඔහුට භාර්යාවන් දෙදෙනෙක් සිටියා. එක් තැනැත්තියක් හන්නා ය. අනෙක් තැනැත්තිය

දාවිත් — පෙනින්නාය. පෙනින්නාට දරුවන් සිටි නමුත් හන්නාට සිටියේ නැත. ඒ නිසා පෙනින්නා නිතරම හන්නා ව කෝප කෙරෙව්වාය.

පොතේ ගුරා — නමුත් එල්කානා වැඩි වැඩියෙන් හන්නාට ආදරේ වීය. මෙය දැනගත් පෙනින්නා හන්නා හඬවන තරමට ඇයව රිදෙව්වාය. ඒයි මෝඩි... ඔයාට ළමයි හදන්නවත් බෑ. හන්නා බොහෝ වේදනාවට පත්ව සිටියා. ඇයට දරුවන් නොමැති නිසා. ඇය නොකා නොබී හඬමින් කාලය ගත කළා. ඇයගේ සැමියා වූ එල්කානා ඇය සැනසීමට කොපමණ උත්සහ කළත් ඇයගේ හදවත නිතරම බිඳී තිබුණා.

.................................................................................................



160Page

පොතේ ගුරා — බැටළුවන් බලා ගනිමින් සිටිය දාවිත්ට, බැටළුවන් කා දමන්නට පැමිණෙන සිංහයන් හා වලසුන්ට නිතරම මුහුණ දෙන්නට සිදුවුණා. ඔහු තරුණයෙක්ව සිටි නිසා මෙවැනි දෙවිලට මුහුණ දීමේදී ඔහු භය වුණා. නමුත් දාවිත් දෙවියන්වහන්සේට යාච්ඤා කළා.


දාවිත් — ස්වාමීනී, සිංහයන්ගෙන් හා වලසුන්ගෙන් මාගේ බැටළුවන් ආරක්ෂා කරන්න.

පොතේ ගුරා — සිංහයන්, වලසුන් හා අනෙක් සතුන්ගෙන් තම බැටළුවන් ආරක්ෂා කර ගැනීමට, ඔවුන්ට විරුද්ධව යාමට දාවිත් නිතරම කැටපෝලය විදීමේ පුහුණුවේ යෙදුණා.

දාවිත් — වුෂ්.... වුෂ්.... වුෂ්....වුෂ්....

පොතේ ගුරා — කැටපෝලෙන් ඉලක්කයටම විදීම පිළිබඳ දාවිත් අති දක්ෂයෙක්ව සිටියා. හැම වෙලාවකම කැලෑ සතුන්ට පහරදීලා උන්ව බිමට දමන්නට දාවිත්ට පුලුවන් වුණා. මේ නිසා වන සත්තු බැටලුවන්ව හපා කන්නට කටට දාගන්නවා දුටු දාවිත් උන්ට ගසා උන්ගේ කටවල් ඉරා බැටලුවන්ව උන්ගේ කටින් මුදවා ගත්තා.

.................................................................................................



161Page

පොතේ ගුරා — එක් දවසක් ඉශ්රරායෙල්වරුන් පිලිස්තිවරුන් සමග යුද්ධයකට මුහුණ දුන්නා. යුධ පිටියේ සිටින තමාගේම සහෝදරයන්ට යම් දේවල් ගිහින් දෙන්නයි කියා තම පියා, දාවිත්ට උපදෙස් දුන්නා. ඔහු එහි ගිය කල, දෙවියන්වහන්සේගේ ජනතාවට අපහාස කරමින් සිටි පිලිස්ති මල්ලවයාව දාවිත් දුටුවා.

ගොලියොත් — හාහ්හ් හා හහ්හ්හ්හා !! මා සමඟ සටනට ඒමට කිසිවෙක් නෑ. උඹලා හරිම දුර්වලයි.

පොතේ ගුරා — " දෙවියන්වහන්සේගේ හමුදාවට අපහාස කරන මේ පිලිස්තියා ඒක කරන්නේ කොහොමද? " දාවිත් කියන්නට වුණා... දාවිත් කියූ මේ දේ අසා සිටි අය ඒ බව සාවුල් රජුට දන්වා සිටියා. රජු දාවිත්ට කතා කළා.

**දාවිත්** — මාගේ ස්වාමීනි... මේ පිලිස්තියා නිසා අපේ සිත් දුර්වල කර ගන්න ඕනේ නෑ. මම ඔබේ දාසයා. මම ඔහු සමග සටනට යන්නෙමි.
දෙවියන්වහන්සේ සැබවින්ම අපට ජය දෙනවා ඇත.

**සාවුල්** — පිලිස්තිවරුන් සමග සටනට යාමට ඔයාට දැන්ම බැරි දෙයක්.
ඔයා තවම තරුණ කෙනෙක්. නමුත් ගොලියොත් කුඩා වයසේ පටන් සටනට උපන් හපන් සමත්කරුවෙක්.

**දාවිත්** — රජතුමනි... මම මගේ පියාගේ බැටලුවන් බලාගෙන සිටිය දී සිංහයෙකු හෝ වළසෙකු ඔවුන්ව ගිලගන්න ආවේ නම් මම උන්ට ගසා, උන්ගේ කටින් ඇද බැටලුවන් ගළවා ගන්නෙමි. ජීවමාන දෙවියන්වහන්සේගේ නාමයට අපහාස කරන මේ අචර්මඡේදිත පිලිස්තියා කවුද?
කොහොමද මූට ඉඩ දෙන්නේ ?

**පොතේ ගුරා** — ගොලියත් දෙවියන්වහන්සේට කරන අපහාසය ගැන දාවිත් දැවෙමින් තැවෙමින් සිටියා. ඔහුගෙන් ජයග්‍රහණය ලබන්නට පුලුවන් කියා දාවිත් බොහෝ සෙයින් විශ්වාස කළා.

..............................................................................................



162Page


**පොතේ ගුරා** — ගොලියත්ට විරුද්ධව සටනට යාමට පෙර, කෙතේදී බැටලුවන් බලා ගන්නට භාවිතා කරන සැරයැටිය හා කැටපෝලය, දාවිත් නැවත ගත්තා.
දොළෙන් මටසිලුටු ගල් 5 ක් ගෙන එය මල්ලේ දමා ගත්තා.
දැන් දාවිත් ගොලියත්ට විරද්ධව යාමට ඉදිරියට මතුවුණා.
ඒ දුටු ගෙලියත් ශබ්ද නගා සිනාසුණා.

**ගොලියොත්** — හහ් හහ් හහ් හා.... හහ් හහ් හහ් හා....
තෝ සැරයැටියක් අරන් එන්නේ මම බල්ලෙක් ද ?
උඹ මෝඩයෙක්. පිස්සෙක්. හහ් හහ් හහ් හා....

**පොතේ ගුරා** — නමුත් දාවිත් ගොලියත්ගේ සරදම්වලට භය වුණේ නෑ.
දාවිත් ගොලියොත් ගේ ඉදිරියටම ගියා.

**දාවිත්** — උඹ මට විරුදධ්ව කඩුවක් ද පිහියක් ද රැගෙන එන්නේ ය.
නමුත් උඹ අපහාස කරන සේනාවල ස්වාමීන්වහන්සේගේ නාමයෙන් මම උඹට විරුද්ධ එමි.

..............................................................................................



163Page

**පොතේ ගුරා** — දාවිත් සටනේ පෙරමුණටම දුවගෙන ගියා. ඔහුගේ බෑගයට අත දැමුවා. එයින් ගලක් ගෙන, කැටපෝලයේ දමා කෙලින්ම පිලිස්තියාගේ නළලට විද්දා. ඒ ගල් පහර පිලිස්තියා නළලට වැදී නළල පසාරු කරගෙන යද්දී මේ සද්දන්ත යෝධයා බිමට ඇදගෙන වැටුණා...
එවිට දාවිත් දුවගොස් පිලිස්තියා ළග සිට ඔහුගේ කඩුව කොපුවෙන් ඇද ඔහු මරා, එයින් ඔහුගේ හිස කපා දැමුවා. පිලිස්තිවරු තමන්ගේ බලවතා මැරුණු බව දැක බයේ පලා දිව්වා. දාවිත් සිංහයන් හා වලසුන් පරාජය කලේ කොහොමද ඒ ආකාරයෙන්ම මේ වතාවෙත් දාවිත් ජයග්‍රහණය කළා.
මක්නිසාද ඔහු දෙවියන්වහන්සේව විශ්වාස කළා.
ඔහුගේ ශක්තියේ රහස නම් දෙවියන්වහන්සේ ය.
මුලින්ම දාවිත් පරාජය කලේ සිංහයන් හා වලසුන් වුණත්, පසුව සද්දන්ත ගොලියොත් වැනි යෝධයෙක් පරාජය කරලා ඉශ්‍රායෙල් ජනතාව ජයග්‍රහණය වෙත මෙහෙයවන්නට නායකත්වය දීමට දාවිත්ට පුලුවන් වුණා.

**ජීවිතයට අදාල කිරීම**

**පුංචි මමත් වීරයෙක්. දෙවියන්වහන්සේට විරුද්ධව කතා කරන අපහාස කරන අය අපිටත් මුණ ගැහෙනවා. ඒ අයට මුහුණ දෙන්නේ කොහොමද? යේසු තුමා අපිට කීවේ සතුරාට ප්‍රේම කරන්නයි. වෛර කරන අයට යාච්ඤා කරන්නයි.**

**අපි දේව පියා සතුටු වන ආකාරයෙන් සතුරාට සලකමු නේද?**